**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 364,000 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරන බව දන්වමි. |
| (iii) | වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.76,975 ක පුනරාවර්තන වියදම් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරන බව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හිඟව පැවති රු. 39,550 ක ලැබිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ආදායම සහ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු. 20,647 ක් වූ හිඟ වැටුප් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණද, එම වටිනාකම වර්ෂය ආරම්භයේදී ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගෙන ගිණුම්වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරන බව දන්වමි. |
| (vi) | ගිවිසුම්ගත සේවා සඳහා ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණු රු. 16,771 ක් පෙර ගෙවුම් ලෙස නොදක්වා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ගිණුම් සඳහා ගැලපීම් කරන බව දන්වමි. |

**1.4** <u>**අනුකූල නොවීම්**</u>

<u>**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**</u>

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | | | |
| (i) 19(xii) වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර 13 ක් වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත ලබාදී තිබුණද ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමත ලිපියක් මත බදුදී ඇත. |
| (ii) 140 වගන්තිය | වරිපනම් බදු අයකිරීම සඳහා දේපල කාලීනව තක්සේරු නොකර 2006 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු අයකර තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2015 වර්ෂයේදී තක්සේරුවක් සිදුකර ඇතත් අවසන් වාර්තාව ලැබී නොමැති හෙයින් මේ දිනවල නැවත අවසන් තක්සේරුවක් සිදුකරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,741,559 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 381,662 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 790,000 | 948,957 | 846,484 | 102,473 | 785,000 | 912,508 | 870,963 | 41,545 |
| (ii) | කුලී | 13,099,200 | 3,690,051 | 2,899,037 | 791,014 | 2,907,000 | 4,125,784 | 3,540,030 | 585,754 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 666,200 | 621,280 | 621,280 | - | 648,700 | 660,070 | 660,070 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,784,000 | 4,446,579 | 3,279,446 | 1,167,133 | 3,504,000 | 3,234,886 | 1,952,187 | 1,282,699 |
| | එකතුව | 17,339,400 | 9,706,867 | 7,646,247 | 2,060,620 | 7,844,700 | 8,933,248 | 7,023,250 | 1,909,998 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 9,706,867 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 2,060,620 ක් හෙවත් සියයට 21 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | මේ වන විට හිඟ ආදායම්වලින් කොටසක් අයවී ඇති අතර වෙනත් ආදායම්වල ඇති හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට උපලේඛනය පිළියෙල කර පළාත් ආදායම් කොමසාරිස් වෙත යවා ඇත. |

**2.2.3** <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වරිපනම් බදු අය කිරීමට සුදුසු ප්‍රදේශ ප්‍රාදේශීය සභාව විසින් අවසන්වරට හඳුනාගත් වර්ෂය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ කලින් කළ හඳුනාගෙන අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කර වරිපනම් අයකරගත යුතුවේ. | දියුණු කළ ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.221,630 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු.181,592 ක් හෙවත් සියයට 82 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කර හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (iii) රජයේ ආයතන 05කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 102,628ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් ගෙවන ලෙස දැනුම් දුන්නද ගෙවීම් කර නොමැති අතර ඉදිරියේදී නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

<u>කුලී</u>

2.2.4

| | | |
|---|---|---|
| (i) 2011 වර්ෂයේ සිට 2016 දක්වා කාල පරිච්ඡේදයට අයත් සභාව සතු දේපල 14ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 383,155 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | ලේඛන නඩත්තු කිරීමේදී වැරදි හිඟ ශේෂයන් ඉදිරියට ගෙනවිත් ඇති අතර ඉදිරියේදී නිරවුල් කරගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවට අයත් බඩල්කුඹුර සතිපොල 2018 වර්ෂය සඳහා බදුදීම වෙනුවෙන් අයවිය යුතු බදු කුලී සහ ප්‍රමාද ගාස්තු රු.284,543 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | මේ වන විට රු. 172,835 ක් අයකරගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් වූ ගිවිසුමේ 8 වන වගන්තිය අනුව කඩකාමර අතුරු බදුදීම් කළ නොහැකි වුවද බඩල්කුඹුර බස් නැවතුම්පොළ කඩකාමර ලබාගත් බදුකරුවන් 5 දෙනෙකු විසින් කඩකාමර 5 ක් අතුරු බදුදී මසකට රු. 7,500 ක සිට රු. 27,500 ක් දක්වා ආදායම් ලබාගෙන තිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩහිමියන් දැනුවත්කර ඉදිරියේදී නීතිමය කටයුතු කරන බව දන්වමි. |
| (iv) | බස් නැවතුම්පල දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩකාමර 13 හි මාසික බදු කුලිය 2016 අප්‍රේල් 20 දිනැති තක්සේරු වාර්තාව මගින් ලබාදී තිබුණද 2016 මැයි සිට 2018 දෙසැම්බර් දක්වා ඉන් කඩ කාමර 10 ක නව තක්සේරු කුලිය අයකර නොතිබුණු බැවින් රු. 348,800 ක මුදලක් අහිමිවී තිබුණි. | නව තක්සේරු අනුව බදු කුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම තක්සේරුව වසර 5 ක් සඳහා පමණක් වන අතර ඊළඟ තක්සේරුවේදී අලාභයක් නොවන ලෙස කුලී අය කිරීමට කටයුතු කරන අතර ටෙන්ඩර් ලබාදීමේදී වැඩිපුර ලංසු මුදලක් අයකරගෙන ඇති බැවින් අලාභය ඉක්මවා ආදායමක් ලැබී ඇත. |

**2.2.5** <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් මාර්ගතලන යන්ත්‍රය කුලියටදීම වෙනුවෙන් ඉකුත් වර්ෂය සඳහා රු. 173,120 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා රු. 16,860 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කර ගත යුතුවේ. | මේ වන විට රු. 30,000 ක් අයකර ගෙන ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව අයකරගතයුතු රු. 89,966 ක ජල ගාස්තු ශේෂයක් විය. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | රු. 67,121 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු. 583,462 ක් හා මුද්දර ගාස්තු රු. 1,077,166 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු උසාවි දඩ සහ මොනරාගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2018 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු මුදල් අයකර ගත යුතුවේ. | උපලේඛන පිළියෙල කර පළාත් ආදායම් කොමසාරිස් වෙත යවා ඇති අතර හිඟ මුදල් ඉදිරියේදී අයකර ගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් ඉන් කාරණා 07ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අනෙකුත් අතුරු ව්‍යවස්ථා 7 සකස් කර වැළඳ ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා කඩිනමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස්කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමි. |

(ඇ) <u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සභාව විසින් කසල ඉවත්කිරීමේ ගාස්තු ප්‍රසිද්ධකර තිබුණද කසල බදු අයකර අදාල කසල කළමනාකරණ වියදම පියවා ගැනීමට කටයුතුකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කසල බදු අයකළ යුතුවේ. | කසල බදු අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) කසල කළමනාකරණය පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. | පුහුණු කිරීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුවේ. | පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමු කරමි. |
| (iii) දෛනිකව රැස්කරන කසල දිරන හා නොදිරන ලෙස වෙන්කර ලබා ගැනීමට කටයුතු කළද දිරන කසල භාවිතා කර කාබනික පොහොර නිපදවීමට කටයුතුනොකර අවිධිමත් පරිදි වලවල් දෙකකට බැහැරකර තිබුණි. | නිසි ක්‍රමවේදයකට කසල බැහැර කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මූලික වැඩ කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී කාබනික පොහොර නිපදවීමට කටයුතු කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | දර්ශක හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 03 ක් 2013 දෙසැම්බර් 03 දින වෙන්දේසි කිරීම සඳහා කහගොල්ල පළාත් යාන්ත්‍රික කාර්යාලයට යවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභා බලප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා සමීක්ෂණයක් කළ යුතුවේ. | මේ දිනවල සමීක්ෂණයක් සිදු කිරීමට හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | සභාවට අයත් කැබ්රථයක 2019 ජනවාරි සිට මයිලෝ මීටරය අක්‍රියවී තිබුණද එය යථා තත්ත්වයට පත්කර නොතිබුණි. | මයිලෝ මීටරය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගත යුතුවේ. | ඉදිරියේදී කඩිනමින් මයිලෝ මීටරය සවිකරමි. |
| (ඈ) | සභාව භාවිතා කරන වාහන 03ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරීට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | (i) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සභාවේ හිඟුරුකඩුව උපකාර්යාලය සඳහා රු. 29,255,282 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර 2017 ජුනි 26 දින සභාවට භාරදී තිබුණද එහි උප කාර්යාලය ස්ථාපනයකර නොතිබුණු අතර ව්‍යාපෘතිය මගින් ලබාදී තිබුණු රු.1,479,300ක් වටිනා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණද නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ල හා අදාල භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | කාර්යාලයේ අවශ්‍යතා සඳහා අලුතින් මිලදී ගැනීම් නොකර උප කාර්යාලයේ ගෘහ භාණ්ඩවලින් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර ඇත. |
| | (ii) ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සඳහා සේවකයන් 06 දෙනෙකු අනුයුක්තකර සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුල වැටුප් හා දීමනා ලෙස රු. 859,592 ක් ගෙවා තිබුණි. උපකාර්යාලය අදාල කාර්යය සඳහා යොදා නොගන්නා බැවින් මෙම වියදම ද නිෂ්කාර්ය වියදමක්වී තිබුණි. | සේවකයින් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම් කළ යුතුවේ. | උප කාර්යාලය ආරම්භ කිරීමෙන් පසු අතිරික්ත සේවකයන් වෙනත් කාර්යයන් සඳහා අවශ්‍ය ස්ථාන වෙත අනුයුක්ත කරමි. |
| | (iii) උප කාර්යාලය ප්‍රයෝජනවත් ලෙස පවත්වා ගෙන යා යුතු ආකාරය පිළිබඳව පළාත් පාලන කොමසාරිස් උපදෙස් ලබාදී තිබුණද එම උපදෙස් අනුව අදාල කටයුතුකර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | මේ වන විට සති පොළක් සහ පුවත් පත් කියවීම් ස්ථානයක් පවත්වා ගෙන යන අතර ඉදිරියේදී පුස්තකාලය ආරම්භ කරමි. |
| (ඊ) | සභාවට අයත් ට්‍රැක්ටර් රථයක ලියාපදිංචි සහතිකය අස්ථානගත වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | අස්ථානගතවීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර කඩිනමින් ලියාපදිංචි සහතිකය ලබාගත යුතුවේ. | දැනට මේ සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් සභාව සතුව නොමැති බවද, ඉදිරි කටයුතු කරන ලෙස විෂය භාර නිලධාරියාට උපදෙස් දෙන ලදි. |
| (උ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු ගෙවිය යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | මේ දිනවල සමීක්ෂණයක් සිදු කරමින් පවතී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සභාවේ තනතුරු 03 කට අදාලව සිටි සේවකයන් 15 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 06 කට අදාලව සේවක පුරප්පාඩු 6ක් පැවතුණි. | අතිරික්ත කාර්යමණ්ඩලයේ තනතුරු අනුමත කර ගැනීමටත් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමටත් කටයුතු කළයුතුවේ. | තනතුරු 15 න් තනතුරු 8 ක් සඳහා 25/2014 චක්‍රලේඛය මගින් අනුමැතිය දී ඇති අතර අනෙකුත් තනතුරු 7 අනුමත කිරීමටත් බඳවා ගැනීම්වලට අදාල ආයතන විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | | |
|---|---|---|
| කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන සඳහා අක්කර 15ක් 2010 දෙසැම්බර් 14 දින සභාවට පවරාගෙන ඉඩමේ මැනුම් කටයුතු සඳහා 2010 වර්ෂයේදී රු. 120,000 ක් වැයකර තිබුණද අදාල වැඩසටහන ක්‍රියාත්මකකර නොතිබුණි. එමෙන්ම මෙම ඉඩමෙහි අනවසරයෙන් පවුල් 26ක් පදිංචිවී සිටින බවද අනාවරණය විය. | කසල ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ආරම්භ කිරීමටත් ඉඩම නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | අනවසර පදිංචිකරුවන්ගේ ගැටුම්කාරී තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි විය. ව්‍යාපෘතිය දැනට කසල බැහැර කරන ඉඩමෙහි ආරම්භ කරන අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් අක්කර 60 රූඩ් 01 පර්චස් 34 ක් වූ ඉඩම් කැබලි 98 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර ඉඩම් කැබලි 90 ක මැනුම් කටයුතුකර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් මැනීම් කටයුතු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවේ. | පවරා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමුකර ඇති අතර මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රු.1,617,483 ක වියදමක් දරා ඉදිකර තිබුණු බෝගහපැලැස්ස ප්‍රදේශයේ කඩකාමර 02 ක් මාර්ග රක්ෂිතයේ ඉදිකිරීම නිසා එම ඉඩම පවරා ගැනීමට නොහැකිවී තිබුණි. | අදාල ආයතන සමඟ සාකච්ඡා කර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි. |

### 3.4.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 02 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකරමි. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා පිළියෙල කර ඇත. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

**ඉටු නොකළ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ව්‍යාපෘති 13ක් ඉටු කිරීමට රු.11,000,000 ක් ඇස්තමේන්තුකර තිබුණද කිසිදු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මකකර නොතිබුණි. | නිශ්චිත කාර්යයන් හඳුනාගෙන අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කළයුතු වේ. | බඩල්කුඹුර නගරයේ ඉදිකර ඇති නව කඩ කාමර 10 ටෙන්ඩර් කර ලැබෙන ආදායමෙන් ව්‍යාපෘති ඉටු කිරීමට අපේක්ෂා කළද එය ටෙන්ඩර් කිරීමට නොහැකි වූ බැවින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 20 සිට සියයට 71 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 12 සිට සියයට 100 දක්වාද විචලනයන් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | විවිධ හේතූන් නිසා විචලනයන් ඇති වූ අතර ඉක්මවා යන වියදම්වලට අදාල වැය ශීර්ෂ සඳහා ප්‍රතිපාදන මාරු කරන ලදි. අතිරේක ඇස්තමේන්තුවලට හේතුව නගරයේ කඩකාමර 10 ටෙන්ඩර් කිරීමට හා එම ටෙන්ඩර් ආදායම මගින් කිරීමට අපේක්ෂා කළ වියදම් ඉතිරිවීම විය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා සිදුකර නොමැති වුවද ඉදිරි වර්ෂයේදී සිදුකරන බව දන්වමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන 2009 ජුනි 9 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | නව කමිටුවක් පත්කර ඇති බවද එය සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. |